**ශීර්ෂය 235 - නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකිම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.2 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල ඇති සංඛ්‍යා අවසාන භාණ්ඩාගාර ගිණුම්වල දක්වා ඇති සංඛ්‍යා සමඟ එකඟවන බවට සහතික වී තිබිය යුතු වුවත් සිගාස් වෙබ් යෙදුම මඟින් ලබා ගත් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (SA -82 ආකෘතියේ) වර්ෂය අවසානයේ ශේෂයක් නොතිබුණද මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය නොවන වත්කම් ශේෂය ලෙස රු.25,086,952 ක් දක්වා තිබුණි. එසේම SA -82 ආකෘතිය මූල්‍ය ප්‍රකාශනවලට අමුණා නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුව සිගාස් වැඩසටහන භාවිත නොකරන බැවින් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ආකෘතිය ඇමුණුම් ලෙස ඉදිරිපත් කළ හැකි නොවිණි. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ආකෘතිය මූල්‍ය ප්‍රකාශන වලට ඇමිණිය යුතු අතර මූල්‍ය ප්‍රකාශනවල ඇති සංඛ්‍යා අවසාන භාණ්ඩාගාර ගිණුම්වල දක්වා ඇති සංඛ්‍යා සමඟ එකඟ වී තිබිය යුතු වේ. |

(ආ) අත්තිකාරම් ලැබීම් හා ගෙවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂය තුළ වැටුපෙන් අයකර ගෙන භාණ්ඩාගාරයට යවා තිබූ රු.775,445 ක් වූ ණය (අත්තිකාරම්) වාරික, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් ලෙස සටහන් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි අත්තිකාරම් වාරික අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් යටතේ සටහන් කරන ලදී. | 2021.11.26 දිනැති අංක 2021/03 දරන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් වූ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය අනුව මුදල් හා හරස් සටහන් යන දෙකම ඇතුලත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුවේ. |

(ඇ) සහනාධාර හා මාරු කිරීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සහනාධාර සහ මාරු කිරීම් රු.67,732 ක් මුදල් වැය කිරීම් යටතේ සහනාධාර සහ මාරු කිරීම් ලෙස වෙනම දැක්විය යුතු වුවත් එම අගය පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්වලට එකතුකර දක්වා තිබුණි. | සහනාධාර සහ මාරු කිරීම් පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ අන්තර්ගත කරන ලද්දේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් පරිදි බව දන්වමි. | 2021.11.26 දිනැති 2021/03 දරන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් වූ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අදාල ආකෘතිය අනුව එය වෙනම දැක්විය යුතු වේ. |

### 1.6.2 ලේඛන හා පොත්පත් විධිමත්ව පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි (සටහන **iii)** සඳහන් වැය විෂයයන් 04කට අදාල එකතුව රු.75,071 ක් වූ බැරකම්, ආයතනයේ බැරකම් ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි. | අදාළ වසර සඳහා නිශ්චිතවම පැන නගින බැරකම් පමණක් බැරකම් ලේඛණයේ සටහන් කරන අතර වසර අවසන එක් වරක් පමණක් ඇතිවන බැරකම්, බැරකම් ලේඛණයේ සටහන් නොකරන බව දන්වමි. | සියළුම බැරකම් බැරකම් ලේඛනයේ සටහන් කර ඒවා බේරුම් කරන අවස්ථාවේදීද එය සටහන් කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) වැය ලෙජරයේ දක්වා තිබූ සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.133,175 ක් වූ බැරකම් 05 ක් බැරකම් ලේඛණයේ දක්වා නොතිබුණු අතර දක්වා තිබූ එක් බැරකමක ශේෂය හා වැය ලෙජරයේ දක්වා තිබූ ශේෂය අතර රු.651 ක වෙනසක් විය. | බැරකම් ලේඛණයේ මොබිටෙල් ආයතනයට අදාළ බිල්පත් සටහන් කිරීමේදී රු 651 ක වෙනසක් සිදුවී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | සියළුම බැරකම් බැරකම් ලේඛනයේ නිවැරදිව සටහන් කර ඒවා බේරුම් කිරීමේ දී ද එය සටහන් කල යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා වැය විෂයන් 03 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 100 සිට සියයට 94 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | ප්‍රාග්ධන වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරි වන ලද්දේ කොවිඩ් ව්‍යසනය හේතුවෙන් ආයතන වසා තැබීමත් කාලසටහනකට අනුව රාජකාරී කිරීමට පැමිණීමත් නිසාවෙන් සහ කිසිදු මිළදී ගැනීමක් සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන නොලැබීමත් නිසාවෙනි. | මුදල් රෙගුලාසි **50** හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව සකසුරුවම් හා කාර්යක්ෂමතාවය පිළිබඳව නිසි සැලකිල්ලෙන් තාත්වික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**විගණන නිරීක්ෂණය**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ | | | |
| (i) 3:7 වගන්තිය | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සියලුම අගයන් ආසන්න රුපියලට වාර්තා කල යුතු වුවත්, 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සංඛ්‍යා ශත අගයන් ද සහිතව දක්වා තිබුණි. | වාර්තාවේ ඇති කරුණු සමග එකඟ වේ. | 2021.11.26 දිනැති 2021/03 දරන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් වූ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) 7.6 වගන්තිය | මුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන පිළියෙල කළ යුතු බව දක්වා තිබුණ ද, හරස් සටහන් ඉවත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් පරිදි හරස් සටහන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ සටහන් කරන ලදී. | 2021.11.26 දිනැති 2021/03 දරන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් වූ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි 7.6 ඡේදය අනුව හරස් සටහන්ද ඇතුලත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වේ. |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂ වලදී එම චක්‍රලේඛය පරිදි කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 කාර්යභාරයන් ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නීති නිර්දේශ තුනක් පිළිබඳව සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක වීමට නියමිතව තිබුණද එම නිර්දේශයන්ට අදාලව අවසන් කෙටුම්පත් අධිකරණ අමාත්‍යතුමා වෙත යැවීමට එකඟ වීම සිදු කර තිබුණි. | වාර්තාවේ ඇති කරුණු සමඟ එකඟ වේ. | ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| (ආ) ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත් කෙටුම්පතේ නීති රාමුව සමාලෝචනය කිරීම 2019 වර්ෂයේ සිටද හා දික්කසාද, භාරකාරීත්වය සහ ජීවිතාන්තය දක්වා නීති ප්‍රතිසංස්කරණ සාකච්ඡා කිරීම 2018 වර්ෂයේ සිට ද සිදු කෙරෙමින් පැවතුණි. | වාර්තාවේ ඇති කරුණු සමඟ එකඟ වේ. | නීති ප්‍රතිසංස්කරණවල කාලීනභාවය ආරක්ෂා වන පරිදි කටයුතු කළ යුතු වේ. |
| (ඇ) සමාගම් පනත සංශෝධනයට අදාල නීති නිර්දේශයන්ගේ ප්‍රගතිය 2020 සහ 2021 වර්ෂ වල ප්‍රගති වාර්තාවට ඇතුලත් කර නොතිබුණි. | අදාළ නීති නිර්දේශ සම්බන්ධයෙන් වාර්තා කිරීමට තරම් ප්‍රගතිශීලී වර්ධනීය තත්ත්වයක් උද්ගත නොවීම මත 2020 දී ඇතුළත් නොකරන ලදී. | දෙපාර්තමේන්තුව සිදු කරන සියළු නීති ප්‍රතිසංස්කරණයන් ප්‍රගති වාර්තාවට ඇතුලත් කල යුතු වේ. |
| (ඈ)කොමිෂන් සභාවේ රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් සලකා බැලීමේ දී 2021 පළමු අර්ධ වර්ෂය තුල රැස්වීම් පවත්වා නොතිබූ අතර දෙවන අර්ධ වර්ෂය තුල රැස්වීම් වාර 06 ක් පවත්වා තිබුණ ද කමිටු සාමාජික සහභාගීත්වය සියයට 48 ක පමණ පහල මට්ටමක පැවතුණි. සාමාජිකයින් පස් දෙනෙකු කිසිඳු රැස්වීමකට සහභාගී වී නොතිබුණි. | නීති කොමිෂන් සභාවේ විෂය සම්බන්ධ කටයුතු කිරීම අධිකරණ අමාත්‍යාංශයේ නීති අංශය මඟින්ද සිදු වන අතර එම කාර්ය තැන් දෙකකදී පුනරාවර්ථනය වීමක් සිදු වේ. එනිසා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් තුමාගේ හා අධිකරණ ඇමතිතුමාගේ මැදිහත් වීමෙන් මේ සම්බන්ධව සභාපතිතුමා ඇතුලු නීති කොමසාරිස්වරුන් සමඟ සාකච්ඡා කර තීරණයකට එළඹෙන බව දන්වා සිටී. | දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය මත රඳා පැවතීම නිසා නියමිත පරිදි රැස්වීම් පවත්වා එහි කාර්යසාධනය වර්ධනය කර ගත යුතු වේ. |

## 3.2 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2021 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරි සැලැස්ම තුල යාවත්කාලීන කරන ලද සංවිධාන ව්‍යුහය, අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය, සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කල ක්‍රියාකාරකම් සැලැස්ම, ක්‍රියාත්මක කල යුතු කාල රාමුව හා අක්මුදල් අවශ්‍යතා සැලැස්ම ආදිය ඇතුලත්ව නොතිබීම නිසා එම ක්‍රියාකාරි සැලැස්ම උක්ත චක්‍රලේඛය ප්‍රකාරව සකස් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධව තොරතුරු සපයනු ලැබුයේ අධිකරණ අමාත්‍යාංශය විසින් අප වෙත යොමු කරන ලද ආකෘති පත්‍රයට අනුකූලව බව දන්වා සිටිමි. | 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.3 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 (2) (2) ප්‍රකාරව 2021 වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | අධිකරණ අමාත්‍යාංශය විසින් යොමු කරන ලද උපදේශාත්මක ලිපියට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 4 යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01 – 2019 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙන් අවධාරණය කර ඇති පරිදි මුදල් රෙගුලාසි 134 හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (3) වගන්තිය ප්‍රකාරව ආයතනයේ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනය අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලබන අතර 2021 වසරේ පැවති කොවිඩ් තත්ත්වය, අභ්‍යන්තර විගණනය සිදු නොකිරීමට හේතු වන්නට ඇතැයි අපේක්ෂා කෙරේ. අභ්‍යන්තර විගණනය පැවැත්වීම අප දෙපාර්තමේන්තුවට අදාල කාර්යයක් නොවන බවද දන්වමි. | අදාල විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වේ. |

## 5 මානව සම්පත් කළමනාකරණය

### 5.1 වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | වාර්තාවේ කරුණු සමඟ එකඟ වේ. | 2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු වේ. |

## 5.2 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් සිදු කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලෙස වුවද 2014 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින ලේකම් තනතුර සඳහා මෙම වාර්තාවේ දින වන විටත් නිත්‍ය පත්වීමක් සිදුකර නොතිබුණි. | ලේකම් තනතුරෙහි පුරප්පාඩු පිරවීමට අධිකරණ අමාත්‍යාංශය විසින් උත්සාහ කළද එයට අවශ්‍ය වන වෘත්තීය සුදුසුකම් සහ වෘත්තීය සේවා කාලය සපිරූ සුදුසු අයදුම්කරුවන් ඉදිරිපත් නොවීම මත එම පුරප්පාඩුව පිරවීමට නොහැකි වී ඇත. | ආයතන සංග්‍රහය ප්‍රකාරව පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ)ආයතනයේ කාර්ය මණ්ඩලයේ අනුමත නිලධාරින් සංඛ්‍යාව 29 ක් වූ නමුත් 2021 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 18 ක් වූ හෙයින් සමස්ථ කාර්ය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව 11ක් විය. | වර්තමානයෙහි දී ලේකම් තනතුරෙහි පූර්ණ කාලීනව නිලධාරිනියක් රාජකාරී ඉටු කරනු ලබන අතර අනෙකුත් තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමින් පවතී. | අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |